# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1716/20 – 2011 ජූලි 27 වැනි බදාදා – 2011.07.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2006 නොවැම්බර් මස 28 වැනි දින අංක 1473/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද 2006 අංක 367 දරන (460 වන අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාවෙන් මෙහි පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියේ උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2006/වීඊටී/155.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 4/5/1-2/739/3.
2011 ජූලි මස 22 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 80/5, ''ගොවිජන මන්දිරය'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහගම්මැද්ද ගමේ පිහිටි මැනුම් අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක මු.පි.ක. 4021 සහ 2007.12.05 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.283ක් පමණ වූ වගුරුවත්ත නමැති ඉඩමට මායිම්:



උතුරට: ආර්. ඩී. සිල්වා සහ තවත් අය හිමිකම් කියන හෙම්බරවත්ත සහ ඩී. එස්. සෝමපාල සහ තවත් අය හිමිකම් කියන වැල්ලගෙවත්ත; නැගෙනහිරට: ඩී. එස්. සෝමපාල සහ තවත් අය හිමිකම් කියන වැල්ලගෙවත්ත සහ එන්. එච්. මුණසිංහ හිමිකම් කියන වැල්ලගෙවත්ත; දකුණට: එන්. එච්. මුණසිංහ හිමිකම් කියන වැල්ලගෙවත්ත; බටහිරට: එන්. එච්. මුණසිංහ හිමිකම් කියන වැල්ලගෙවත්ත සහ ආර්. ඩී. සිල්වා සහ තවත් අය හිමිකම් කියන හෙම්බරගෙවත්ත.

08 – 310

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 698/16 හා 1992.01.24 වැනි දින දරන රජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 1992 අංක 24 හා 1992.01.13 වැනි දින දරන ආඥාවෙන් මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තර ලෙස දක්වා ඇති ඉඩම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද ඉඩමේ භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 698/16 හා 1992.01.24 වැනි දින දරන

*අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 1992 අංක 24 හා 1992.01.13 වැනි දින දරන ආඥාව මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 03/ජේ/87/ඩබ්එස්/462.
දිසාපතිගේ අංකය: අත්/17/585.
2011 ජූලි මස 22 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 80/5, ''ගොවිජන මන්දිරය'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ නුගේගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලෙපත්තුව සුළු කොට්ඨාසයේ මහරගම නගර සභාවේ අංක 11 දරන කෝට්ටේ - ගල්කිස්ස කොට්ඨාසයේ මාදිවෙල සහ මිරිහාන ගම්වල පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක කො.7089 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 හා 02 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0920ක් වන බිම් කැබලි දෙක (02):

01. **කැබලි අංක 01 – පෙලන්ගහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0560ක් පමණ**

උතුරට: මහා මාර්ගය; නැගෙනහිරට: ඇළ; දකුණට සහ බටහිරට: ගුණසේන සේනාධීර හිමිකම් කියන පෙලන්ගහකුඹුර.

02. **කැබලි අංක 02 – සරන්බාස්ගෙ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0360ක් පමණ**

උතුරට: මහා මාර්ගය; නැගෙනහිරට: මහා මාර්ගය සහ ඩබ්. උපතිස්ස හිමිකම් කියන සරන්බාස්ගේ කුඹුර; දකුණට: ඩබ්. උපතිස්ස හිමිකම් කියන සරන්බාස්ගේ කුඹුර; බටහිරට: ඇළ.

08 - 311

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 (1) වැනි වගන්තිය යටතේ ආඥාව අවලංගු කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 698/16 හා 1992.01.24 වැනි දින දරන රජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද්දාවූ ද, 1992 අංක 21 හා 1992.01.13 වැනි දින දරන ආඥාවෙන් මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තර ලෙස දක්වා ඇති ඉඩම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද ඉඩමේ භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39(1) වැනි වගන්තිය යටතේ මාහට පැවරී ඇති බලතල අනුව අංක 698/16 හා 1992.01.24 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 1992 අංක 21 හා 1992.01.13 වැනි දින දරන ආඥාව මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 03/ජේ/87/ඩබ්එස්/462.
දිසාපතිගේ අංකය: අත්/17/585.
2011 ජූලි මස 22 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 80/5, ''ගොවිජන මන්දිරය'',
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ නුගේගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලෙපත්තුව සුළු කොට්ඨාසයේ මහරගම නගර සභාවේ අංක 11 දරන කෝට්ටේ - ගල්කිස්ස කොට්ඨාසයේ මාදිවෙල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක කො.7087 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0448ක් පමණ වන දිවෙල කුඹුර නමැති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

උතුරට: මහා මාර්ගය; නැගෙනහිරට: ඇළ; දකුණට: එල්. ඩී. ලයනල් හිමිකම් කියන දිවෙල කුඹුර; බටහිරට: පාර්ලිමේන්තුවේ සිට ජයවර්ධනපුර රෝහලට යන මාර්ගය.

08 - 312

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.